සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | නර්තනය (දේශීය) | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 01 |
|---|---|---|---|---|---|---|---|

## නැටුම් (දේශීය) I

✶ සියලු ම අයදුම්කරුවන් I කොටසේ ප්‍රශ්න 30 ටම පිළිතුරු සැපයිය යුතුයි. එයට අමතරව II උඩරට නර්තනය හෝ III පහතරට නර්තනය හෝ IV සබරගමු නර්තනය යන කොටස තුනෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සැපයිය යුතුය.

ප්‍රශ්න අංක 01 සිට 40 දක්වා දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ලකුණු කරන්න.

1. ශාන්තිකර්මවලට පරිබාහිර ශාස්ත්‍රීය නර්තන අංගයකි.
   1. වන්නම්  2. ප්‍රශස්ති  3. අස්නෙ  4. දෙවොල්
2. මැටි කර්මාන්තයේ දී භාවිත සුවිශේෂ උපකරණයකි.
   1. මා දූල  2. සකපෝරුව  3. ඉල්ලම්කුරු  4. වට්ටිය
3. තිත්, තෙයි, මාත්‍රාවක් ඇදෙන බව, අක්ෂර කීපයක් එකතු කිරීම හැඳින්වීම සඳහා ප්‍රස්තාරකරණයේ දී භාවිත සංකේත වන්නේ,
   1. ∧, ---, ∪, /  2. ∧, ∪, ---, /
   3. ∧, /, ---, ∪  4. ∪, ∧, /, ---
4. හේවිසි වාදන හා තේවා වාදන,
   1. අවමංගල කටයුතු සඳහා යොදාගනී  2. මංගල කටයුතු සඳහා යොදාගනී
   3. ආගමික කටයුතු සඳහා යොදා ගනී  4. යුධ කටයුතු සඳහා යොදාගනී
5. සාම්ප්‍රදායික නර්තන අංගවලදී උඩුකය සඳහා හැට්ට භාවිත කරන්නේ,
   1. පහතරට හා උඩරට ශාන්තිකර්මවලදී ය
   2. පහතරට හා සබරගමු ශාන්තිකර්මවලදී ය
   3. උඩරට හා සබරගමු ශාන්තිකර්මවලදී ය
   4. පහතරට ශාන්තිකර්මවලදී පමණය
6. චාමර නර්තනයේ දී යොදාගන්නා ගායන විශේෂයකි.
   1. චාමර හා රබාන්  2. චාමර හා ප්‍රශස්ති
   3. චාමර හා සවරන්  4. චාමර හා හටන්

7. විස්මය නැමති ස්ථායි භාවය තුළින් උපදින්නේ,

1. ශෘංගාර රසයයි
2. හාස්‍ය රසයයි
3. කරුණා රසයයි
4. අද්භූත රසයයි

8. 2+2+4 තිත් රූපයට තාල තැබීමේ නිවැරදි ආකාරය දැක්වෙන වරණය තෝරන්න.

1. /, /, ^
2. /, ^, /
3. ^, /, /
4. ^, ^, /

9. සිතෙහි පහළවන්නා වූ විවිධාකාරී මනෝභාවයන් උපාංග තුළින් ප්‍රකාශ කිරීම.

1. ආංගික අභිනයයි
2. සාත්වික අභිනයයි
3. ආහාර්ය අභිනයයි
4. වාචික අභිනයයි

10. ගැමි පරිසරයේ සංසිද්ධීන් තේමා කොට ගෙන ගද්‍ය හා පද්‍ය ලක්ෂණ අන්තර්ගතව රචනා වූ ගායන විශේෂයකි.

1. රබන් කවි
2. ටීකා
3. ඔංචිලිවාරම්
4. නමස්කාර ගාථා

11. "රටකට මව් සමඟින් එ නැව් නැග යන කළ අපෙ මුනිඳුන්"......... මෙලෙස ආරම්භ වන්නේ.

1. කුළු කවියකි
2. චාමර කවියකි
3. බලිකවියකි
4. රබන් කවියකි.

12. කෝළම් හා සොකරි රඟමඬලෙහි දක්නට ලැබෙන සුවිශේෂී අංගවන්නේ,

1. චිත්‍ර වස්ත්‍ර හා වෙස් අත්ත
2. වෙස් අත්ත හා වංගෙඩිය
3. කඩවුන හා අඹ අත්ත
4. වංගෙඩිය හා ලන්තෑරුම

13. දේවාලවල කාන්තාවන් රැඟුම් දැක් වූ බව සඳහන් වන්නේ ගම්පල යුගයටඅයත්,

1. ඉබන් බතුතා ගේ වාර්තාවේය
2. පාහියන් භික්ෂුවගේ වාර්තාවේය
3. රොබට් නොක්ස් ගේ වාර්තාවේය
4. ස්පිල්බර්ජන්ගේ වාර්තාවේය

14. සොකරි ගැමි නාටකයේ කථා පුවත හා බැඳි මිනිස් චරිත කීපයකි.

1. වඩුරාළ, කපුරාළ, ආරච්චි
2. කපුරාළ, ආරච්චි, රාළහාමි
3. වඩුරාළ, කපුරාළ, ගුරුහාමි
4. වඩුරාළ, ගුරුහාමි, ආරච්චි

15. රාශ්ලීලා නර්තන අංගය ඇතුළත් නර්තන සම්ප්‍රදාය වන්නේ,

1. භරත
2. කතක්
3. කතකලි
4. මනිපුරි

16. අංග රචනයේ දී පළමුවෙන්ම භාවිතා කරන ආලේපන ද්‍රව්‍යයකි.

1. නිය ආලේපන
2. තොල් ආලේපන
3. ඇස් ආලේපන
4. පදනම් ආලේපන

17. "හනික වරෙව් කොල්ලනේ../මෙම ගිම්හාන ග්‍රිස්ම වූ කාලේ ... යන ගීත.

1. චිත්‍රපටි ගීත වේ
2. ටෙලිනාට්‍ය ගීත වේ
3. ගුවන්විදුලි නාට්‍ය ගීත වේ
4. වේදිකා නාට්‍ය ගීත වේ

18. කතකලි නර්තනයේ දී භාවිත කරන සුසිර වාද්‍ය භාණ්ඩයකි.

1. චෙංගලම්
2. මංජිරා
3. කුම්භු
4. බටනලා

19. අංග රචනයේ දී අවශ්‍ය වන පාරිසරික සාධක වන්නේ.

1. නිවැරදි ආලෝක තත්ත්වය, පිරිසිදු වාතාශ්‍රය හා සිසිල් බව
2. අඩ අඳුර, පිරිසිදු වාතාශ්‍රය, හා මද සිසිල් බව
3. අඳුර, ආලෝකය, හා පිරිසිදුවාතාශ්‍රය
4. අවකාශය, පිරිසිදු වාතාශ්‍රය, සිසිල් බව

20. නර්තන කලා ඉතිහාසය පිළිබඳ තොරතුරු විමසීමේදී ඉපැරණි ගැමි නැටුම් දෙකක්ලෙස සැළකිය හැක්කේ,


1. කුළු හා මෝල්ගස්
2. රබන් හා මෝල්ගස්
3. ලී කෙළි හා කළගෙඩි
4. ලී කෙළි හා පතුරු

21. රස භාව සංකල්පය පිළිබඳ තොරතුරු ඇතුළත් ග්‍රන්ථ දෙකකි.

1. නාට්‍ය ශාස්ත්‍රය හා කාව්‍ය ශාස්ත්‍රය
2. රසවාද විවරණය හා නාට්‍ය ශාස්ත්‍රය
3. නාට්‍ය ශාස්ත්‍රය හා අභිනය දර්පණය
4. නාට්‍ය ශාස්ත්‍රය හා දස රූපකය


22. රංගවස්ත්‍ර, අංගරචනය හා රංග භූමි අලංකරණය යන කාර්යන්හි දී ප්‍රධාන කලා මාධ්‍ය වන්නේ,

1. චිත්‍ර කලාව
2. සංගීත කලාව
3. මූර්ති කලාව
4. කැටයම් කලාව


A


B


C


D

the National e-learning Portal for The General Education

23. අනුරාධපුර, පුත්තලම......... යන ප්‍රදේශයන්හි සොකරි ගැමි නාටකය සඳහා භාවිත වාද්‍ය භාණ්ඩය දක්වා ඇත්තේ,

1. A රූපයෙනි
2. B රූපයෙනි
3. C රූපයෙනි
4. D රූපයෙනි

24. ගොයම් නැටුම සඳහා යොදාගනු ලබන සුවිශේෂී වාද්‍ය භාණ්ඩය දැක්වෙන්නේ,

1. A රූපයෙනි
2. B රූපයෙනි
3. C රූපයෙනි
4. D රූපයෙනි

25. හේවිසි වාදනය සඳහා භාවිත වාද්‍ය භාණ්ඩ දෙකකි.

1. A හා B
2. B හා C
3. C හා D
4. A හා D

26. කතකලි නර්තනයේ ප්‍රධාන ගායකයා හා සහාය ගායකයා හඳුන්වන නාමයන් දක්වෙන්නේ,

| | A | B | C | D |
|---|---|---|---|---|
| 1. | පොන්නානි | කර්නාටක | තාලම්පට | කෙණ්ඩිපාළිය |
| 2. | මුදුන්කාලය | දෙවොල් පද | සිංගිඩි | ආවැන්දුම |
| 3. | සූත්‍රධාරී | සවරං | හත්පදය | පෙනකොම්බා |
| 4. | හින්දුස්ථාන් | නයා යක්කම | අඹවිදමන | ආසන් |

1. 1 පේළියේ A හා B තීරුවලය
2. 1 පේළියේ A හා 2 පේළියේ C තීරුවලය
3. 3 පේළියේ A හා 4 පේළියේ D තීරුවලය
4. 2 පේළියේ B හා 3 පේළියේ D තීරුවලය

27. මනිපුරි නර්තනය සඳහා භාවිත වන සංගීත සම්ප්‍රදාය හා වාද්‍ය භාණ්ඩය සඳහන් වන්නේ,

1. 4 පේළියේ A තීරුවේ හා 3 පේළියේ D තීරුවේය
2. 2 පේළියේ A තීරුවේ හා 1 පේළියේ B තීරුවේය
3. 3 පේළියේ B තීරුවේ හා 2 පේළියේ D තීරුවේය
4. 1 පේළියේ B තීරුවේ හා 4 පේළියේ A තීරුවේය

28. පහතරට හා උඩරට සම්ප්‍රදායන්ට අයත් නර්තන අංග සඳහන් වන්නේ.

1. 2 පේළියේ B හා D තීරුවලය
2. 3 පේළියේ B හා C තීරුවලය
3. 4 පේළියේ B හා C තීරුවලය
4. 1 පේළියේ C හා D තීරුවලය

29. සබරගමු හා උඩරට නර්තන සම්ප්‍රදායන්ට අයත් නර්තන අංග ඇතුළත් වන්නේ.

1. 2 පේළියේ A හා D තීරුවලය
2. 2 පේළියේ B හා D තීරුවලය
3. 4 පේළියේ B හා C තීරුවලය
4. 3 පේළියේ C හා D තීරුවලය

30. දේශීය නර්තන සම්ප්‍රදායන් තුනටම පොදු ශාස්ත්‍රීය නර්තන අංගය දක්වෙන්නේ.

1. 2 පේළියේ A තීරුවේය
2. 3 පේළියේ B තීරුවේය
3. 2 පේළියේ D තීරුවේය
4. 3 පේළියේ C තීරුවේය

## II කොටස උඩරට

31. පා සරඹ නැටීමේ දී සුරල් පෑගීම කරනු ලබන්නේ.

1. 3 වන පා සරඹයේ දීය
2. 8 වන පා සරඹයේ දීය
3. 9 වන පා සරඹයේ දීය
4. 12 වන පා සරඹයේ දීය

32. තාල රූප දෙකකින් යුත් වන්නමකි.

1. තුරඟා වන්නම
2. සිංහරාජ වන්නම
3. මුසලඩි වන්නම
4. වෛරොඩි වන්නම

33. ගැටබෙරයෙන් නිකුත් වන මූලික බීජාක්ෂර වන්නේ,

1. තත්, දිත්, තොං, නං
2. තක,ජිත්, තොං, නං
3. තත්, ජිත්, තොං, නං
4. තකු, ජිකු, තොං, නං

34. උඩරට වෙස් ඇඳුම් කට්ටලයේ පළමුව සිරසට පළඳින හිර්ෂභරණය.

1. පාහින්පතයි
2. ජටාවයි
3. සිබාබන්ධනයයි
4. නෙත්තිමාලයයි

35. " වන පැත්ත බිය පත්ව සයනම්"..... මෙම කවියේ දෙවන කවි පදය,

1. නොනැවත යනු නැත එතැනින්
2. දුටත් යනෙන විටත් දුවන
3. මේ ඇත්තමයි සත්ත කියනෙම්
4. පැන අඩි පතුඩි බුදිමින්

36. කොහොඹායක් කංකාරියෙහි භාවිත රංග භාණ්ඩයක් නොවන්නේ,

1. ඌරාගේ අනුරුව
2. කොතලය
3. දුන්න හා ඊ ය
4. මෝල් ගස

37. "තත් තත් තක්කඩ තරිකිට,ජිත්,ජිත් ජිත්කඩ තරිකිට"........ මෙලෙස ආරම්භ වන්නේ.

1. 9 වන ගොඩ සරඹයේ කස්තිරමයි
2. 12 වන ගොඩ සරඹයේ කස්තිරමයි
3. 10 වන ගොඩ සරඹයේ කස්තිරමයි
4. 11 වන ගොඩ සරඹයේ කස්තිරමයි

38. බෙරපදයී, තානම, කවිය, කස්තිරම, .....................හා .................. පිළිවෙලින් උඩරට වන්නමක කොටස් වේ. හිස් තැනට අදාළ පිළිතුර වන්නේ,

1. ඉරට්ටිය, සීරුමාරුව
2. ඉරට්ටිය අඩව්ව
3. සීරුමාරුව, අඩව්ව
4. අඩව්ව හා සීරුමාරුව

39. "තකුත.ක ජිජිකුඳ ගජිත ගජිත කුඳ" ............... මෙය

1. මාත්‍රා 4 + 4 තනිතිතට අයත් කස්තිරමකි
2. මාත්‍රා 4 + 4 තනිතිතට අයත් අඩව්වකි
3. මාත්‍රා 4 + 4 තනිතිතට අයත් සීරුමාරුවකි
4. මාත්‍රා 4 + 4 තනිතිතට අයත් බෙරපදයකි

40. උඩරට නර්තන සම්ප්‍රදාය පිළිබඳ පර්යේෂණාත්මක ග්‍රන්ථ රචනා කර ඇත්තේ,

1. මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතා
2. මහාචාර්ය ජයසේන කෝට්ටෙගොඩ මහතා
3. මහාචාර්ය එම්. එච්. ගුණතිලක මහතා
4. ආචාර්ය ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය

The National e-learning Portal for The General Education

## III කොටස පහතරට

31. "රිම් දැහිං.... රෙග දිත ගත ගඳගුත්තම්" ............ මෙය.

1. 10 වන ඉලංගම් සරඹයයි
2. 9 වන ඉලංගම් සරඹයයි
3. 12 වන ඉලංගම් සරඹයයි
4. 11 වන ඉලංගම් සරඹයයි.

32. 2+2+3 තුන්කිතේ තාල රූපයට අයත් සින්දු වන්නමකි.

1. ලලිතරාග තාලය
2. හනුමන්තා තාලය
3. ශුද්ධ තාලය
4. තාතිලිංචි තාලය

33. පහතරට බෙරයෙන් නිකුත් මූලික බීජාක්ෂර වන්නේ,

1. තත්, ජිත්, තොං, නං
2. තක, ජිත්, තොං, නං
3. තත්, දිත්, තොං,නං
4. තක, ජික, තොඟ, නඟ

34. පහතරට තෙල්මේ ඇඳුම් කට්ටලයේ නළලට පළඳිනු ලබන ආභරණය,

1. ජටාව
2. නලල් පටිය
3. නෙත්තිමාලය
4. තැල්ල

35. "සඳ සන්දර දිගු පුන්දර දිලිමත් ඔබ යසටා" ..................... මෙම කවියේ දෙවනපදය

1. සඳ සන්දරනොව මන්තර අදහාගත් ලෙසටා
2. සඳ සන්දර පැරදුණ මෙන් සැඟ වී මෙර ගිරටා
3. සඳ සන්දර පතිවල්ලභ සෙතදෙන් සව් සතටා
4. සඳ සන්දර නව මන්තර සැඟ වී මෙර ගිරටා

36. දෙවොල්මඩු ශාන්තිකර්මයේ භාවිත රංග භාණ්ඩයකි.

1. දුන්න
2. කාඟුල
3. ඌරාගේ අනුරුව
4. කොතලය

37. තකදිමි, තකදොමි, කිත්තක් කටිතක ....... මෙලෙස ආරම්භ වන්නේ.

1. අන්තාඩියකි
2. ඉරට්ටියකි
3. සුරලකි
4. කලාසමකි

38. බෙරපදය, තානම ................ ඉරට්ටිය පිළිවෙලින් පහතරට සින්දු වන්නමක කොටස් වේ.

1. සිරුමාරුව
2. අන්තාඩිය
3. කවිය
4. සුරල

39. "ගුඳ ගදිගත" වට්ටම නටනු ලබන්නේ,

1. මාත්‍රා 4 තා ලයට ය
2. මාත්‍රා 3 තාලයට ය
3. මාත්‍රා 2 තාලයට ය
4. මාත්‍රා 2 + 3 තාලයට ය

The National e-learning Portal for The General Education

40. පහතරට නර්තන සම්ප්‍රදාය පිළිබඳ පර්යේෂණාත්මක ග්‍රන්ථ රචනා කරන ලද්දේ,

1. මහාචාර්ය ජයසේන කොට්ටේගොඩ මහතා
2. මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතා
3. මහාචාර්ය එම්. එච්. ගුණතිලක මහතා
4. ආචාර්ය ශ්‍රියානි රාජපක්ෂ මිය

## IV කොටස සබරගමු

31. "තරිකිට දිරිකිට, දිරිකිට තරිකිට - දිරිකුං තරිකුං තරිකිට දිරිකිට" මෙය,

1. 9 වන දොඹින පදයයි
2. 10 වන දොඹින පදයයි
3. 11 වන දොඹින පදයයි
4. 12 වන දොඹින පදයයි

32. මණ්ඩුක වන්නම නටනු ලබන්නේ,

1. මාත්‍රා 2 + 3 තාලයටය
2. මාත්‍රා 2 + 4 තාලයටය
3. මාත්‍රා 3 + 4 තාලයටය
4. මාත්‍රා 4 + 4 තාලයටය

33. දවුල් බෙරයෙන් නිකුත් වන මූලික බීජාක්ෂර වන්නේ,

1. තත්, දිත්, තොං, නං
2. තක, දිත්, තොං, නං
3. තත්, ජිත්, තොං, නං
4. ජෙං, ජෙං, කිත්, තක්

34. පබළු ඇඳුම්කට්ටලයේ මැණික් කටුවට පැළඳිනු ලබන ආභරණය හඳුන්වන්නේ.

1. අත් පටි
2. හස්තකඩ
3. කයිමෙත්ත
4. හැඩකැල්ල

35. "පානා යසසින් සිරිපිරි කුළුනෙන් හිඳ වාරාඩි"...... මෙහි දෙවෙනි පදය,

1. ගානා හිමිසිත් පිනවන යසසින් නෙක වාරාඩි
2. බූනා රජසිත් එක ලෙස නිරතුරු වීවාඩි
3. ගානා හිමිසිත් එක ලෙස නිරතුරු වාරාඩි
4. සේනා මැද චිත් කී මේ වන්නම දනු විරාඩි

36. පහත් මඩුවේ භාවිත රංග භාණ්ඩයකි.

1. ඊගස
2. මෝල්ගස
3. උනුනුපියන
4. කෙණ්ඩිය

37. ජිංත ගත ගත ගදිත කුද කුද/// ජිංත ගත කුද ගදිත කුදගත්... මෙය,

1. ඉරට්ටියකි
2. කස්තිරමකි
3. අන්තාඩියකි
4. කලාසමයකි

38. දවුල් පදය, තානම, කවිය, .................... අඩව්ව. පිළිවෙළින් සබරගමු වන්නමක කොටස් වේ. මෙහි හිස්තැනට අදාළ පිළිතුර වන්නේ.

1. ඉරට්ටිය
2. කස්තිරම
3. කලාසම
4. සුරල

39. තහර් ද තත් තත්, තතත් තත් තත්, තහර් ද තත්කිට තකට කුඳ දොං ................. මෙය

1. පට්ටුතල් මාත්‍රයේ කලාසමයි
2. ගමන් මාත්‍රයේ කලාසමයි
3. පට්ටුතාල මාත්‍රයේ අඩව්වයි
4. සිංදු මාත්‍රයේ අඩව්වයි

40. සබරගමු නර්තන සම්ප්‍රදාය පිළිබඳ පර්යේෂණාත්මක ග්‍රන්ථ රචනා කරන ලද්දේ,

1. ආචාර්ය ශ්‍රීයානි රාජපක්ෂ මිය
2. මහාචාර්ය ජයසේන කෝට්ටේගොඩ මහතා
3. මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතා
4. මහාචාර්ය එම්. එච්. ගුණතිලක මහතා

The National e-learning Portal for The General Education

3460

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: නර්තනය (දේශීය) | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 02 |

## නැටුම් (දේශිය) II පත්‍රය

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4 ක් ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

**1.**

(1). මාත්‍රා 2 + 3 තාලය සුළු මැදුම් දෙතිත ලෙස හඳුන්වන අතර ................................ තාලය දෙසුළු මහ තුන්තිත නමින් හැඳින්වේ.

(2). කතකලි නර්තන සම්ප්‍රදාය උගන්වන ආයතනය ........................ නමින් හැඳින්වේ.

(3). වර්ෂ ...................... දී අ.පො.ස. උසස් පෙළ විෂය මාලාවට නර්තන විෂය ඇතුළත් කරන ලදී.

(4). කොහොඹායක් කංකාරියේ තරඟකාරී යුගල වාදනයක් ලෙස ............................ වාදනය නම්කළ හැකිය.

(5). රබන් චාමර, ආදී කවි ආසාතාත්මක ගායනා වන අතර නමස්කාර ගාථා, අෂ්ඨක .............. ගායනා වේ.

(6). 'හපනා' නැමැති ළමා මුද්‍රා නාට්‍ය ........................ විසින් නිර්මාණය කරන ලදී.

(7). "අඳුන් ගාන්නී නෙත් දෙක ඹමරි කරන්නී" ........ මෙය ..................... ගැමි නාටකයේ චරිත හඳුන්වා දීමේ කවියකි.

(8). දෙවුන්දර උපුල්වන් දේවාලය පසුබිම් කොට ගෙන .................. වන්නම් බිහි වී ඇත.

(9). සිංහල කුළු නැටුමට සමාන ද්‍රවිඩ ගැමි නැටුම ......................... වන අතර ද්‍රවිඩ වෙම්බු නැටුමට සමාන සිංහල ගැමි නැටුම .................... නම් වේ.

(10). මනිපුරි නර්තනයේ රාධාගේ ඇඳුම ලෙස සළකන කාන්තා වස්ත්‍රාභරණයේ දිග සාය ..................... නමින් ද හැට්ටය ................................ නමින් ද හැඳින්වේ.

2. (I). මාත්‍රා 3 + 4 තාල රූපයට අයත් බෙර පදයක්/දවුල් පදයක් ප්‍රස්තාර කරන්න.

(II) "පුරවර මැද බැඳි රං ඔංචිල්ලා........

උඩයන තරමට පුදුම නොවෙල්ලා". මෙම කවි පද මාත්‍රා 3 + 3 තාලයට ප්‍රස්තාර කරන්න.

(III) මාත්‍රා 4 + 4 තාලයට අයත් කස්තිරමක්/ ඉරට්ටියක්/ කලාසමක් ප්‍රස්ථාර කරන්න.

3. (I) ශාන්තිකර්මවලදී වාචික අභිනය යොදාගන්නා අවස්ථා දෙකක් ලියන්න.

(II) නර්තන සම්ප්‍රදායන් තුනෙහි අංගික අභිනයෙහි දක්නට ලැබෙන වෙනස්කම් දෙකක් ලියන්න.

(III) පහතරට නර්තන සම්ප්‍රදාය ආහාර්ය අභිනය අතින් පොහොසත්ය. කරුණු 3 ක් ඇසුරෙන් මේ කියමන සනාථ කරන්න.

4. (I) අනුරාධපුර හා පොළොන්නරු යුගවලට අයත් නර්තන කලාව පිළිබඳ තොරතුරු ඇතුළත් ලිඛිත මූලාශ්‍ර දෙකක් නම් කරන්න.

(II) එම මූලාශ්‍ර දෙකට අයත් සාධක දෙකක් ඉදිරිපත් කරන්න.

(III) ඉහත සාධක ඇසුරෙන් එවකට නර්තන කලාව පැවැති තත්ත්වය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

5. (I) ගැමි නාටක හා ගැමි නැටුම් වල දක්නට ලැබෙන වෙනස්කම් 2 ක් ලියන්න.

(II) සොකරි හා කෝළම් ගැමි නාටකයන්හි දක්නට ලැබෙන සමාන අසමානතා දෙක බැගින් ලියන්න.

(III) විනෝදාස්වාදය ලබාදීම ගැමිනාටක වල එක් අරමුණකි. සොකරි හා කෝළම් හි චරිත දෙකක් ඇසුරෙන් මෙම කියමන සනාථ කරන්න.

The National e-learning Portal for The General Education

6.



A



B

(I) A,B රූපවලින් දක්වෙන නර්තන සම්ප්‍රදායන් දෙක නම් කරන්න.

(II) එම නර්තන සම්ප්‍රදායන් සඳහා යොදා ගනු ලබන සංගීත සම්ප්‍රදායන් හා ප්‍රධාන අවනද්ධ භාණ්ඩ දෙක නම් කරන්න.

(III) ඉහත සඳහන් නර්තන සම්ප්‍රදායන් අතරින් එක් නර්තන සම්ප්‍රදායකට අයත් රංග වස්ත්‍රාභරණ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

7. (I) රූපවාහිනි නාලිකා ඔස්සේ විකාශනය වන ළමා නර්තන වැඩ සටහන් **දෙකක් නම්** කරන්න.

(II) එම වැඩසටහන් දරුවන් ගේ නර්තන කුසලතා වර්ධනයට ඉවහල් වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(III) එම නර්තන අංග විචිත්‍රවත්ව ඉදිරිපත් කිරීමට යොදාගත් උපක්‍රම 3ක් විස්තර කරන්න.

The National e-Learning Portal for The General Education